# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර, සේවා ගණය, පුරප්පාඩු සංඛ්‍යාව | සුදුසුකම් | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | සවහන | වයස් සීමාව |
|---|---|---|---|---|
| කලාසි ශිල්පීය නොවන 11 : 2 (NS2)<br>10 | දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වීම.<br>සහ<br>පිහිනීමේ හැකියාව | 11 : 2 (NS2)<br>මූලික වැටුප් පියවර : රු. 33815/=<br>වාර්ෂික වේතනාධිකය : රු. 290/=<br>(දළ වැටුප මාසිකව රු. 109000/= ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ ප්‍රායෝගික හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | අවුරුදු 18 – 45 අතර විය යුතුය.<br>(රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

iv. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

v. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.

vi. රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු / සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම හා ලිපිනයන් සහිතව සකස් කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැලෙන් 2026.06.03 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපැලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. අදාළ **අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන),**
**මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාසය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**කොච්චිකඩේ, කොළඹ 13.**